# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 3 දරන
# සංස්ථා නීතිඥ ආයතන
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ජනවාරි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල: ශත 20 යි    තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1980 අංක 3 දරන සංස්ථා නීතිඥ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 14 වන දින.]

එල්. ඩී.—ඕ. 61/79.

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 33 දරන සංස්ථා නීතිඥ ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 3 දරන සංස්ථා නීතිඥ ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 33 දරන සංස්ථා නීතිඥ ආයතන පනතේ 5 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 33 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(1) අමාත්‍යවරයාගේ නිර්දේශය පිට, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන, පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලයක් විසින් ආයතනයේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය :—

(අ) අවුරුදු දහයකට නොඅඩු පළපුරුද්ද ඇති නීතිඥවරයකු විය යුතු සභාපතිවරයා ; සහ

(ආ) අවුරුදු හතකට නොඅඩු පළපුරුද්ද ඇති නීතිඥවරයන් විය යුතු වෙනත් සාමාජිකයන් හතර දෙනෙක්.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*"මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ කවරකු විසින් ද යන වග.*

6. (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටියි නම්, ඔහු මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට, පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා සාමාජිකයකු තමන් අතුරෙන් තෝරා පත්කර ගත යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමකදී තීරණය කිරීම සඳහා ඇති යම් ප්‍රශ්නයක්, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සම සමව ලැබී ඇති විට, මූලාසනය දරන සාමාජිකයාට දෙවන හෝ තීරක ඡන්දයක් තිබිය යුතු ය".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.